


# ඩිජිටල් සම්පත් පැතිකඩ

## Digital Resource Profile




වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව

වයඹ අභිමානය

# වයඹ අභිමානය

## වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව



- දැක්ම -

" පහසුකම් සපිරි
යහපාලිත පුරවරයක් "

- මෙහෙවර -

වෙන්නප්පුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ
ජනතාවගේ ජන ජීවිතය නංවාලීම උදෙසා පහසුකම්
සපයමින්.......
සභාව සතු සම්පත් හා අනෙකුත් ආදායම්, ආධාර
යහපාලනයෙන් යුක්තව, කාර්යක්ෂමව, ඵලදායීව
කළමණාකරණය කර පුළුල් ජනතා සහභාගීත්වයකින්
උපරිම සේවාවක් සැපයීම
අපගේ මෙහෙවර වේ.....

වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව

වයඹ අභිමානය

SECRETARY W.D.LUCIAN

077 0830642 / 070 2749873

OFFICE

031 2255276 - 031 2255379

wennappuwaps@gmail.com

031 2253249

GIS OFFICER - K.J.P.S.S.FERNANDO

077 7705431

M.G.T.K. FERNANDO

076 0365175

# ඩිජිටල් සම්පත් පැතිකඩ

## Digital Resource Profile

වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව

වයඹ අභිමානය

# ඩිජිටල් සම්පත් පැතිකඩ නිර්මාණය කිරීම

වර්ථමාන රාජ්‍ය සේවයට නවීන තාක්ෂණයේ දායකත්වය උපරිමයෙන් ලබා දීමේ අරමුණ ඇතිව මෙම සම්පත් පැතිකඩ නිර්මාණය කර ඇත. මේ සඳහා වැඩි වශයෙන් භූගෝලීය තොරතුරු තාක්ෂණය භාවිතා කර ඇති අතර ඊට අමතරව වෙනත් තාක්ෂණික මෙවලම්ද අවශ්‍ය පරිදි ඇතුලත් කර ඇත.

පරිශීලකයාට මුද්‍රිත ලිටපත මඟින් සාමාන්‍ය අවබෝධයක් ලබාගත හැකිවන පරිදි නිර්මාණය කර ඇතත් යම් ක්ෂේත්‍රයන් පිළිබඳව වැඩි විස්තර අවශ්‍ය අයට මෙහි ඇති QR කේත භාවිතා කර වැඩි විස්තර ලබා ගැනීමේ හැකියාව පවතී.

වර්ථමානයේ මුද්‍රණ වියදම ඉතා අධික වන අතර මෙහි අඩංගු සියළුම තොරතුරු මුද්‍රණය කිරීමට පිටු 2000 කට අධිකව අවශ්‍ය වේ. එම වියදම ඉතාම අවම මට්ටමකට ගෙන ඒමට බොහෝ තොරතුරු මෘදු පිටපත් ආරක්ෂාකාරීව නිර්මාණය කර ඊට අවශ්‍ය කේතයන් පොත තුල මුද්‍රණය කර ඇත.

මෙම නිර්මාණය තවමත් පර්යේෂණ මට්ටමේ පවතින අතර නියමු ව්‍යාපෘතියක් ලෙස වෙන්නප්පුව ප්‍රාදේශිය සභාවේ ක්‍රියාත්මක කිරීමට ලැබීම භාග්‍යකි.මේ සඳහා සම්පත් දායකත්වය ලබා දුන් වයඹ පළාත් භූගෝලීය තොරතුරු තාක්ෂණික ඒකකයට හා වෙන්නප්පුව ප්‍රාදේශිය සභාවේ භූගොලීය තොරතුරු තාක්ෂණික ඒකකයේ නිලධාරීන්ට ප්‍රසංශාව හිමිවිය යුතුය.

එම්.එම්.එස්.ප්‍රේමචන්ද්‍ර
විමර්ශණ නිලධාරී
පළාත් පාලන දෙපාර්තමේන්තුව (වයඹ)

# වෙන්නප්පුව ග්‍රාම නාමය

වෙන්නප්පුව නමින් මේ ගම හැඳින්වීම පිලිබඳව මතිමතාන්දර කිහිපයක්ම වෙයි. සමහරුන්ගේ මතය වනුයේ මෙහි විසූ වන්නියාර්වරයෙකු නිසා වෙනන්ප්පුව යන නම ඇති වු බවයි. ඉතිහාසයේ දැක්වෙන කරුණු අනුව වන්නි 18 ක් සඳහා වන්නියාර් නම් ප්‍රාදේශිය පාලකයන් පත් කර ඇත. මේ 18 දෙනාට අමතරව මීගමුව තෝප්පුතොටුපලේ සිට කුදිරමලෙයිකන්ද දක්වා වූ ප්‍රාදේශිය පාලනය සඳහා තවත් වන්නියාර්වරු 5 දෙනෙක් වූහ. මෙකී වන්නියාර්වරුන්ගෙන් කෙනෙකු වෙන්නප්පුව ගම් සීමාවේ පදිංචි වූ බව කියවේ. වෙන්නප්පුව වැවට නැගෙනහිරින් මාටින්ද පෝරස් මාවත අසල පිහිටි මාලිගාවත්ත නමින් ව්‍යාවහාර වන බිමේ පැරණී රාජකීය ගොඩනැගිල්ලක නටබුන් අදද දක්නට ලැබේ. මේ නටබුන් අතර වැළලී ගිය ගල්කණු, සෙල් මුවා අඩිතාලම්, ඉපැරණී පැතලි උළු හා ගඩොල් ආදිය හමු වේ. ඉහත කී වන්නියාර් වාසය කලේ මේ ස්ථානයේ බවටත් ඒ අසලම ඇති පතහ ඔහුගේ නාන පොකුණ වශයෙන් පරිහරණය කළ බවටත් කටකතා ඇත. වන්නියාර් විසූ පුරය වන්නියාර්පුර ලෙසත් එය පසුව වෙන්නපුර වෙන්නප්පුව ආදි සැටියෙන් වෙනස් වූ බවත් ඔහුගේ අදහසයි.

සාම නාමය සම්බන්ධව තවත් මතයක් වී ඇත්තේ විෂ්ණු දේවාලය යන අර්ථයෙන් වෙන්නප්පුව කියා නම් කර්ණ බවයි. ඒ පිළිබඳ පුවත මෙසේය. බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේ ඇති ලියවිල්ලකින් උපුටා පල කලේ යැයි කියන මුක්කර සටහන නැමැති ලිපියක මේ ප්‍රදේශයේ වරක මුක්කර වර්ගයා පදිංචිව සිටි බවක් දැක්වේ. ශිව භක්තිකයන් වූ මොවුන්ගේ එක් බලවත් අධිපතියෙකු විසින් දැනට කිඹුල්ගාල නමින් හැඳින්වෙන ගිං ඔය වක්‍රව ගලා යන උතුරු නැගෙනහිර කොනේ ශිව හෙවත් විෂ්ණු දෙවියන් වෙනුවෙන් දෙවොලක් ඉදි කරනු ලැබූ බවත් එම දෙවොලේ නටබුන් තවමත් දක්නට ඇති බවත් සමහරු කියති. ඔවුන්ගේ මතය වනුයේ වෙන්නප්පුව පුරාවෘත්තය මේ දෙවොලෙන් ඇරඹෙන බවයි. විෂ්ණු දෙවියන්ට කැප වූ ප්‍රදේශ විෂ්ණු පුරය හෙවත් වෙණුපුර නම් විය. වෙණුපුර වෙන්නප්පුව විය. එසේත් නැතිනම් මුක්කර අධිපතියා තම නිලනාමයෙන් හෝ විෂ්ණු දෙවියන්ට දෙමළෙන් කී නම අනුව හෝ වෙන්නාර්පුරම් වෙන්නාර්පූර් යනුවෙන් වෙනස් වී පසු කාලෙක වෙන්නප්පුව කියා පද පෙරළුණ බවයි.

වරුණ නැමැති ප්‍රධානියෙකු මෙහි පදිංචි වීම නිසා ඔහු නමින් වර්ණපුර යනුවෙන්ද එය පසුව වෙන්නපුර වී එයිනුත් අනතුරුව වෙන්නප්පුව වූ බවට තෙවැනි මතයක් ද වෙයි.

පුත්තලම ප්‍රදේශයේ මිනිසුන් තලා පෙලා හිරිහැර කරමින් වස්තු කොල්ලකමින් සිටි මුතු ක්‍රිස්නා නම් දෙමළ ප්‍රධානියෙකුගේ අනුගාමිකයෙකු වන වන්නම්පොන්නේ නැමැත්තා වෙන්නප්පුවේ පදිංචි සිටි බවත් ඔහුගේ නමින් වෙන්නප්පුව යයි මේ ගමට නම යෙදුනු බවත් සිව්වැනි මතයකින් ඇති වේ. මේ කියන මුතු ක්‍රිස්නා ගැන කෝට්ටේ රජ කළ ධර්මපරාක්‍රමබාහු රජතුමා විසින්

(1591-1597) මොළගොඩ දුක්ගන්නා හිටි බණ්ඩාර කුමරුට ප්‍රධානය කරන ලදුව කිරි වත්තේගම ශ්‍රී සන්නස් ලියන මොහොට්ටාල විසින් ලියන ලද සන්නසේ සඳහන් වෙයි. මේ හැරුණු විට ග්‍රාම නිමය සම්බන්ධයෙන් තවත් දත කීපයක් වෙනත් ඒවා එතරම් වැදගත් යයි නොපෙනෙන හෙයින් මෙහිලා සඳහන් නොකෙලෙමු.

ගමේ ආරම්භය අදට අවුරුදු 800 කටත් වඩා වැඩි වුවද මුලදී මේ ගම වෙන්නප්පුව නමින හැඳින්වූ බවත් නොපෙනේ. වෙන්නප්පුව අවට ඇති ගම් කීපයක නම් ලංකා ඉතිහාසය සම්බන්ධ නොයෙකුත් ලිපි ලේඛන හා සන්නස්පත්‍රවල සඳහන් වී තිබෙනත් අලගියවන්න මොහොට්ටාල (ක්‍රි.ව 1593-1645) සම්පාදනය කල තෝම්බුවේ නීලකරාව ගෝත්‍රය ගැන කියවෙන තැන ඇති වෙන්නප්පුව ගැන සුළු සඳහන හැරුණු විට ලංකාවේ ඉංග්‍රීසි යුගය වෙනතුරුම කිසිම ඉතිහාසකරුවකුගේ හෝ වියතෙකුගේ ලිපි ලේඛනවල වෙන්නප්පුව ගැන කිසිම සඳහනක් නැත. කලින් කළ වෙන්නියාර්පුර, වෙණුපුර, වර්ණපුර, වෙන්නත්තිල යන නම් වලින් හැඳින්වූ මේ ගම වෙන්නප්පුව නමින ලියාපදිංචි වී ඇත්තේ ක්‍රි.ව 1826 දී ඉංග්‍රීසි විසින් ජන ලේඛනය ගන්නා අවස්ථාවේදීය.

## ජනාවාස

VI වැනි පරාක්‍රමබාහු (1415-1467) අවධියේදී පුත්තලම - හලාවත ප්‍රදේශ මුක්කර නම් කොල්ලකාරයින්ගේ ග්‍රහණයට හා පීඩනයට හසුවූ බවද රජතුමා ඉන්දීය කුලී හමුදාවන්ගේ සහාය ඇතිව වයඹ ප්‍රදේශයේ ඔවුන්ගේ ග්‍රහණයෙන් බේරා ගත් බවද වැලිගම ශ්‍රී සුමංගල හිමියන්ගේ ඉතිහාස පොතෙන් හෙළි වේ. වේලක්කාර නොහොත් අගම්පඩි සේනා වශයෙන් නම් කෙරුණු මෙම බටයෝ ඉන්දියාවෙන් ගෙන්වා ගනු ලැබූ සූර්යය හා චන්ද්‍ර වංශිකයෝ වූහ. අර්සකුලසූරිය,කුලකුලසූරිය,වර්ණකුලසූරිය ආදි අධිපතීන්ගේ යුත් කෞර්ව වංශික සේනාධිපතියෝ වයඹ දිග මුහුදුබඩ ප්‍රදේශ ආරක්ෂා කලෝය. මෙම පිරිස සින්දාත්‍රිය වයික්කාල අංගම්පිටිය ආදි කොටගෙන ප්‍රදේශය පුරා ව්‍යාප්තව එම ප්‍රදේශයන්හි පදිංචි වූහ. මුලින් ආ කෞරව අධිපතීන්ගෙන් ඥාතීහු ද විටින් විට මේ ප්‍රදේශයන්ට සංක්‍රමණය වූහ.

මෙසේ ලංකාවේ බටහිර හා වයඹ දිග ප්‍රදේශවල ජනවාස ඇති කරගත් කෞරව වංශය පිළිබඳව කුරුකුල චරිත හෝ කෞරව වංශය යන පොත් වලින් කරුණු හෙළිදරව් වේ. එහි කෞරව පෙළපත් නාම 24 ක් වශයෙන් නැවත ද මෙසේ පෙළ ගන්වයි.

1. ආරච්චිගේ
2. වර්ණගේ
3. ලියනගේ
4. කංකානමගේ
5. කපුගේ
6. ගලපත්තිගේ
7. ගුරුන්නාන්සේලාගේ
8. ගුරුගේ
9. තන්ත්‍රිගේ
10. තෙල්ගේ
11. තුප්පහිගේ
12. දේවගේ
13. පටබැඳිගේ
14. බඳුගේ
15. මරක්කලගේ
16. මණ්ඩඩිගේ
17. වඩුගේ
18. මෛත්‍රිගේ
19. මෙරෙඤ්ඤගේ
20. විදානගේ/විතානගේ
21. වත්තගේ
22. සට්ටබිගේ
23. හැන්නැදිගේ
24. හේවාගේ

ආදි ඉහත අකාරාදි පිලිවෙලින් සැකසුණු පෙළපත් නාම නානාවිධ කාර්යයන් හෝ රාජකාරි සේවාවන් අරමුණු කරගෙන පුරාණය පටන් ඇති වූ ඒවාය.

1153 පමණේදි වෙන්නප්පුව පදිංචි වූ කුරුණෑගල,ගල්ගමුව හා කුරු කෝරලයෙන් පැමිණි සිංහලයන්ද කෞරව වාංශිකයන් බව බොහෝ දෙනාගේ මතයයි. ඒ සිංහලයන් සමග මෙසේ වරින් වර පැමිණි කෞරවයන් සම්මිශ්‍ර වූවාට සැක නැත. කෞරව වංශය ගැන මෙවන් විසතරාත්මක සඳහනක යෙදුනේ ජාති,වංශ,කුල,ආගම්,උඩපාත වශයෙන් රටේ ඇති භේද හා බෙදීම් අපද අනුමත කරන නිසා නොව වෙන්නප්පුවේ පදිංචිකාරයන් ඉතිහාසයට සම්බන්ධ කිරීමේදි ඇතිවන අසීරුතම් වලින් හා ගැටළු වලින් මිදීම සඳහි බව කියනු කැමැත්තෙමු.

සැබැවින්ම කුල ගෝත්‍ර පසෙක තබා ලංකා සිංහල දෙමළ එකම මූලයක එකම පිරිසක් එකම වර්ගයක් හැටියට පිළිගන්නට තරම් අප තුල එකඟතාවයක් ඇති වුවහොත් අද පවතින ජාති භේදය බින්න වී යනවා පමණක් නොව වෙන්නප්පුව ජනතාව අතරද කිසිම භේදයක් මොනම තැනකින්වත් ඇතිවීමට ඉඩක්ද නැති වේ.

ඓතිහාසික ලිපි ලේඛන මත කෙලින්ම සනාථ කළ නොහැකි වූවද වෙන්නප්පුවේ උරුමක්කාරයන් ගැන සොයා බැලීමේදි අපට අසා දැනගන්නට ලැබුණු කරුණු මෙහිලා ලුහුඩින් දක්වනු කැමැත්තෙමු.

ඓතිහාසික ලිප ලේඛන මත කෙලින්ම සනාථ කළ නොහැකි වූවද වෙන්නප්පුවේ උරුමක්කාරයන් ගැන සොයා බැලීමේදි අපට අසා දැන ගන්නට ලැබුනු කරුණු මෙහිලා ලුහුඩින් දක්වනු කැමැත්තෙමු.

ඉංග්‍රීසින් ලංකාව අල්ලා ගත් බව ආරංචි වූ සැනෙකින්ම මෙතෙක් උඩරට රජ යටතේ සේවයේ යෙදී සිටි මෙහි විසූ වන්නියාර් ගමෙන් පලා ගොස් ඇත. ඔහුගේ දෙවැන්නා වශයෙන් සේවය කල මහ ලේකම් මීට ටික දිනකට පසු මිය ගොස්ය. එම මහ ලේකම්ගේ වැන්දඹු බිරිඳ, දූවරු  පස් දෙනා හා බාලම පුතාද මහ ලේකම් ගෙදර සිටියෝය. මේ පවුල ගමේ සිටි අනෙකුත් අයවලුන් අතර කැපී පෙනුනා පමණක් නොව ඔවුන්ගේ ගෞරවයටද පාත්‍ර විය.

පසු කලෙක රත්ගමින් මෙහි පැමිණි සාමෙල් සිරිවර්ධන, බිංගිරිය කළු ගමින් පැමිණි එම ගම් දෙටුවාගේ පුත්‍රයා, උඩුගම්පලින් පැමිණි උඩුගම්පල තරුණයා, බැල්ලරාවෙන් පැමිණි පොල්පේරු (රන්පෙරන්නා) ගේ පුත්‍රයා යන අය මහ ලේකම් පවුලේ වැඩිමහල් දූ වරුන් හතර දෙනා පිළිවෙලින් විවාහ කර ගත්හ. බාලම දියණිය මෙහි විසූ වීර කොණ්ඩ ආරච්චි පවුලේ කෙනෙකු ආවාහ වූවාය. (මෙහි බාල දියණිය, ඥාති දියණියයි ඇතැම අය පවසති.) මේ වන විටත් මහලේකම් පවුලේ එකම පිරිමියා වගකීම් බාර දිය නොහැකි කරම් බාල වියේ පසු වූ බැවින් පවුලේ මූලිකයා හැටියට කටයුතු කලේ වැඩිමල් දියණිය සරණපාවාගත් රත්ගමයා හෙවත් සාමෙල් සිරිවර්ධනය.

**<u>වෙන්නප්පුව ප්‍රදේශයේ පෙළපත් නාම පටබැඳීම.</u>**

නම් ලියාපදිංචියේදි රත්ගමින් පැමිණි තරුණයා රතුගමගේ නමින්ද, කළුගමින් පැමිණි තරුණයා කළුගමගේ යන්න නමින්ද, උඩුගම්වලින් පැමිණි තරුණයා උඩගම්පලගේ නමින්ද, වැල්ලරාවෙන් පැමිණි තරුණයා යන අර්ථවත් පොන්නම්පෙරුම යන නමන්ද, මහ ලේකම්ගේ පුත්‍රයා මහ ලේකම් නමින්ද , තමන් රිසි පරිදි කුලවන්නම් ලබා ගත්හ.

බාල දියණිය ආවාහ වූ වීර කොණ්ඩ ආරච්චි එම පෙළපත් නමින්ද, දෙවැනි පරම්පරවේදි මහ ලේකම් පවුලට බැඳුණු මහතෙල් පෙළපත ද තම පෙළපත් නාම නොවෙනස්ව ඉදිරියට ගෙන ගියෝය.
දෙවැනි හා තුනවන අවස්ථාවලදි වෙන්නප්පුවේ පදිංචියට ආ ඇතැම් අයද මෙහිදි තමා උපන් ගම අනුව නම් සකස් කර ගත් බව පෙනේ. ඇතැමෙක් තමන්ගේ නියම පෙළපත් නම් හා පෞද්ගලික නම් එසේම භාවිතා කළෝය.

ගාල්ලගේ, දෙහිවලගේ, කොළඹගේ, කටුනැකගේ, මිරිස්සගේ, පෝරුතොටගේ, ආදි පෙලපත් නම් ගම් මඅල් කරගෙන ඇති වූ ඒවාය. ජයසිංහ ආරච්චිගේ, කුට්ටික කානමගේ, ජයසූරිය කුරණගේ, ඥාණ කංකානමගේ, කළුතර කංකානමලාගේ යන ආදි පෙළපත් නම් ගමත් පෙළපතත් හෝ තනතුර එකට සවිකර ගැනීමකි.

වෙන්නප්පුව නින්දගම් කල පවුල් හත ප්‍රතිකාල් ක්‍රමය අනුව නාමයෙන් අගට ප්‍රනාන්දු කුලවන්නම සමඟ කතෝලිකයන් බවට පත් වී ඇත්තේ තුනවන පරම්පරාවේදිය.

වෙන්නප්පව හතරවන පරම්පර්වේදි කළුගම, මහතෙල්, මහ ලේකම් යන පෙළපත් නාම වලට පෙරටුව වර්ණකුලසූරිය යන අභිදානය එකතුකර ඇත.

**වෙණුපුර සන්නස**

මෙම සන්නසට අනුව ගිංඔය යුරින් පටන්ලෙන මහ මුහුදේ ඇත්සොඬෙක් පොච්චන ගැඹුර දක්වා නැගෙනහිර දෙසත්, බටහිර දෙසත් මාහිම් කොට උතුරු කැලයෙන් කටුනේරියත්, දකුණු කැලයෙන් දූම්මලදෙනියත් වෙන් කරන කඩඉඩම් උත්ර් දකුණ මායිම් කොට, වෙණුපුර (වෙන්නප්පුව) ගම පවරා දුන් බව සඳහන් වෙයි.


**උරුමය බෙදා ගැනීම**

ඉහත කී සන්නසෙහි අයිතිය වන වෙන්නප්පුව නින්ද ගමේ වගා කෙරුණු ගොඩ ඉඩම් හා වෙල්යාය හිත් හෝදිසිය අනුව කොටස්


හතරකට බෙදන ලදි. මෙම කොටස් හත මහ ලේකම්,රතුගම,කළුගම, උඩුගම්පල, පොන්නම්පෙරුම, වීර කොණ්ඩ ආරච්චි, මහතෙල් ( දෙවැනි පරම්පරාවේ විවාහ සම්බන්ධකම් මත) යන උරුමකාරයන් හත් දෙනාට අයිති විය. අද ගමේ පාරවල් අනුව ඉහත කී උරුමය කොටස් දළ වශයෙන් දක්වතොත් සීමාවන් මෙසේය. නුගගහ මුල්ලේ සිට කඩවත පාර දක්වා උතුරු සීමාව පොන්නම් පෙරුමගේ පෙළපතටද, කඩවත පාරේ සිට හෙළන් මාවත දක්වා නැගෙනහිර සිට බටහිරට බිම් කොටස කළුගමගේ පෙළපටද, හෙලන් මාවතේ සිට තෝමස් ප්‍රනාන්දු මාවත දක්වා නැගෙනහිරේ සිට බටහිර දෙසට විහිදෙන බිම් තීරුව උඩුගම්පලගේ පෙළපතට ද , චාල්ස් විලියම් මාවතින් දකුණට විහිදි  යන වැව ආශ්‍රිතය ප්‍රදේශය මහ ලේකම් පුතාටද, තෝමස් ප්‍රනාන්දු මාවතේ සිට ප්‍රැන්සිස් සේවියර් මාවත දක්වා අලුත් පාර දක්වා මායිම් කර එය බිම් තීරුව රතුගමගේ පෙළපතටද, වැව ආශ්‍රිත උතුරු කොටස වීරකොණ්ඩ ආරච්චි පෙළපතටද අයිති වන ලෙස බෙදා වෙන් කර ගත්හ.

මේ අතර පොන්නමපෙරුමගේ හා රතුගමගේ පවුල් දෙකට මෙම බිම් කොටස් බෙදීමේදි අඩුවක් පෙනී ගියත් පසුව ඇති කරගත් සම්මුතියක් අනුව පොන්නම්පෙරුමගේ පවුලට දැන් ලුණුවිල හන්දිය යනුවෙන් හැදිනවෙන ප්‍රදේශයෙනුත්, රතුගමගේ පවුලට හෙළන් මාවත ප්‍රදේශයෙනුත් බිම් කොටස් දුන් බව කියවේ. කෙසේ නමුත් අක්කර 1600 (එක්දහස් හයසීයක්) පමණ බිම් ප්‍රදේශය පවුල් අතර බෙදා ගැනීම සිමකාමීව සිදු වී ඇත.


# <u>බල ප්‍රදේශයේ සිතියම</u>



ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ කොට්ඨාස දැක්වෙන සිතියම



# ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ ග්‍රාම නිලධාරි කොට්ඨාස දැක්වෙන සිතියම




# GN DIVISION OF WENNAPPUWA PRADESHIYA SABHA

## LEGEND

GND

- 481A - ALUTTOTA
- 484 - ANGAMPITIYA EAST
- 484B - ANGAMPITIYA WEST
- 476A - BANDIRIPPUWA EAST
- 476 - BANDIRIPPUWA NORTH
- 476B - BANDIRIPPUWA WEST
- 480A - BOLANA
- 484A - BOLAWATTA
- 488 - BORALESSA EAST
- 488B - BORALESSA NORTH
- 488C - BORALESSA SOUTH
- 488A - BORALESSA WEST
- 466C - BOTHALEGAMA
- 474B - DANKOTUWA EAST
- 474 - DANKOTUWA NORTH
- 474A - DANKOTUWA SOUTH
- 474C - DANKOTUWA WEST
- 458 - DIKWELA
- 490 - DUMMALADENIYA EAST
- 490A - DUMMALADENIYA NORTH
- 490B - DUMMALADENIYA SOUTH
- 489 - DUMMALADENIYA WEST
- 471 - ETIYAWALA NORTH
- 471A - ETIYAWALA SOUTH
- 473 - GODELLA
- 477A - GONAWILA SOUTH
- 468 - HALDADUWANA NORTH
- 468A - HALDADUWANA SOUTH
- 468C - HALDADUWANA WEST
- 485A - HANATHOTUPALA
- 464A - HUNDIRAPOLA
- 470A - IHALA BUJJAMPALA
- 474D - IHALA DUMMALAKOTUWA
- 469 - IHALA MOHOTTIMULLA
- 459A - JANKURAWELA
- 492D - KADAWATHA
- 464C - KAHATAWILA EAST
- 464B - KAHATAWILA WEST
- 460 - KALUWACHCHIMULLA
- 481B - KAMMALA
- 475 - KATUKENDA EAST
- 475A - KATUKENDA WEST
- 466 - KIRIMETIYANA EAST
- 466D - KIRIMETIYANA NORTH
- 466E - KIRIMETIYANA SOUTH
- 466F - KIRIMETIYANA WEST
- 493 - KOLINJADIYA EAST
- 493B - KOLINJADIYA NORTH
- 493C - KOLINJADIYA SOUTH
- 493A - KOLINJADIYA WEST
- 462 - LIHIRIYAGAMA
- 467E - LUNUVILA SOUTH
- 467 - LUNUWILA EAST
- 467F - LUNUWILA WEST
- 489A - MEDA DUMMALADENIYA
- 477B - MEDA GONAWILA
- 468B - MEDA HALDADUWANA
- 475B - MEDA KATUKENDA
- 466A - MEDA KIRIMETIYANA
- 467D - MEDA LUNUWILA
- 492B - MEDA ULHITIYAWA
- 491B - MEDA WENNAPPUWA
- 463 - MELLAWA
- 472 - METIKOTUWA
- 487 - MIRISSANKOTUWA NORTH
- 487A - MIRISSANKOTUWA SOUTH
- 473A - MORAKKULIYA
- 471B - MOTEMULLA
- 485 - NAINAMADAMA EAST
- 486 - NAINAMADAMA WEST
- 470 - PAHALA BUJJAMPALA
- 474E - PAHALA DUMMALAKOTUWA
- 469A - PAHALA MOHOTTIMULLA
- 466B - PANSAL HANDIYA
- 464 - POTHUWATAWANA
- 483 - RANGAMMULLA
- 461 - SENDIRIYAMULLA
- 481 - SINDATHRIYA
- 460A - SINGAKKULIYA
- 467B - SIRIGAMPALA NORTH
- 472A - THAMARAKULIYA
- 480 - THAMBARAWILA
- 482B - THOPPUTHOTA
- 465 - THULAWALA
- 467C - UDASIRIGAMA
- 492 - ULHITIYAWA NORTH
- 492A - ULHITIYAWA SOUTH
- 492C - ULHITIYAWA WEST
- 482 - WAIKKALA NORTH
- 482A - WAIKKALA SOUTH
- 486B - WELLAMANKARAYA
- 491A - WENNAPPUIWA SOUTH
- 491D - WENNAPPUWA EAST
- 491 - WENNAPPUWA NORTH
- 491C - WENNAPPUWA WEST
- 459 - YOGIYANA

# යටිතල පහසුකම් විස්තරය


- මාර්ග විස්තරය

| | | | |
|---|---|---|---|
| | ප්‍රමාණය | | දුර |
| 01. මුළු මාර්ග සංඛ්‍යාව | - | 4035 | (945.35 KM) |
| 02. මාර්ග සංවර්ධන අධිකාරිය සතු මාර්ග සංඛ්‍යාව | - | 06 | (43.57 KM) |
| 03. පළාත් මාර්ග සංවර්ධනය සතු මාර්ග සංඛ්‍යාව | - | 47 | (116.83 KM) |
| 04. ප්‍රාදේශිය සභාව සතු මාර්ග සංඛ්‍යාව | - | 3909 | (780.41 KM) |
| 05. පුද්ගලික මාර්ග සංඛ්‍යාව | - | 80 | (4.54 KM) |

- මතුපිට තලය අනුව ප්‍රාදේශිය සභා සතු මාර්ග වර්ගීකරණය

| | | | |
|---|---|---|---|
| | ප්‍රමාණය | | දුර |
| 01. තාර ප්‍රමාණය | - | 1711 | (450.47 KM) |
| 02. කාපට් ප්‍රමාණය | - | 74 | (166.30 KM) |
| 03. කැටගල් ප්‍රමාණය | - | 83 | (21.69 KM) |
| 04. බොරළු ප්‍රමාණය | - | 1703 | (184.40 KM) |
| 05. කොන්ක්‍රීට් ප්‍රමාණය | - | 464 | (122.49 KM) |

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මාර්ග ජාලය විහිදා දක්වන සිතියම




## මාර්ග ජාලය තුළ ඇති අනෙකුත් විස්තරය


| | | |
|---|---|---|
| 01. වීදි ලාම්පු ප්‍රමාණය | - | 17550 |
| 02. බෝක්කු ප්‍රමාණය | - | 798 |
| 03. පාලම් ප්‍රමාණය | - | 05 |
| 04. තැලවිලි ප්‍රමාණය | - | 03 |
| 05. පැතිබැමි ප්‍රමාණය | - | 11 |
| 06. කාණු පද්ධති ප්‍රමාණය | - | 32 |

# යටිතල පහසුකම් ස්ථරය


මාර්ග පද්ධති, වීදි පහන්, පාලම් බෝක්කු ආදී සියලු පහසුකම් හා නඩත්තු විස්තර කාලීනව යාවත්කාලීන කරමින් ගබඩා කර පවත්වා ගන්නා අතර ඒ මඟින් අවශ්‍ය අවස්ථා වලදී යොදා ගැනීම සිදු කරනු ලබයි.
එලෙස ක්‍රියාත්මක කිරීමට යෝජිත මෙම ව්‍යාපෘතිය කාලීන අවශ්‍යතාවක් ලෙස හඳුන්වාදිය හැක.
මේ මඟින් සිදු කරනු ලබන සංවර්ධන ව්‍යාපෘති තොරතුරු ඕනෑම අවස්ථාවක අධීක්ෂණය කිරීමට හා බැලීමට හැකියාව පවතී.රට තුල පවතින සම්පත් හිඟකම, නාස්තිය, වංචාව පහසුවෙන් හඳුනා ගැනීමට අවස්ථාව මේ මඟින් සැලසේ.

# වීදි පහන් සිතියම


STREET LAMP DISTRIBUTION IN WENNAPPUWA PS AREA
N
ST_LAMP [17550]
ROAD
SCAN ME
0
1
2 km
SOURCE : GOOGLE SATTELITE IMAGE & GPS TRACKING
DESIGNED BY : GIS UNIT NWP & WENNAPPUWA PS
DATE : 2024.02.23


CULVERT OF WENNAPPUWA PS AREA
N
240500.000
234000.000
227500.000
99000.000
103500.000
108000.000
WEN_CULVERT [819]
BC [343]
BRI [5]
HC [455]
MC [3]
RW [11]
BOUNDRY
CULVERT_ATTRIBUTE_TABLE
0 1 2 km
SOURCE :- GOOGLE SATELLITE HYBRID & GPS TRACKING
DESIGNED :- DOLG GIS UNIT
DATE :- 2024/02/22

# කාණු පද්ධතිය



DRAIN ON WENNAPPUWA PRADESHIYA SABHA
100000.000
110000.000
240000.000
230000.000
N
LEGEND
DRAIN
ROAD
PRDD
PS
PVT
RDA
GND
SCAN ME
SOURCE : GOOGLE SATTELITE & GPS TRACKING
DESIGNED : M G T K FERNANDO & WEN/PS/GIS UNIT
DATE : 2025/04/08
1 0 1 2 3 km

# දියුණු කල ප්‍රදේශ


වෙන්නප්පුව ප්‍රාදේශිය සභාවේ දියුණු කළ ප්‍රදේශ 04 ක් ප්‍රකාශයට පත්කර ඇති අතර, එම කොට්ඨාශ පහත පරිදි වේ.


1. වෙන්නප්පුව
2. කම්මල්පත්තුව
3. දංකොටුව
4. කිරිමැටියාන

මෙම සියළු කොට්ඨාශ වල වරිපනම් බදු ගෙවන ඒකක සංඛ්‍යාව 16114 ක් වන අතර ඒ තුලින් ප්‍රාදේශීය සභාවට වාර්ෂිකව ලැබෙන ආදායම් රුපියල් 19,822,000.00


දියුණුකළ ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීමේ ගැසට් නිවේදනය


වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ
වෙන්නප්පුව සංවර්ධන ප්‍රදේශ
N
wennappuwa - lunuwila road
Canel
wennappuwa lake
wennappuwa lake
Chilaw-Colombo road
සිතියම
පාර
මාර්ග සංවර්ධන අධිකාරිය
පළාත් මාර්ග
ප්‍රාදේශීය සභා මාර්ගය
ප්‍රධාන මාර්ගය
සම්බන්ධීකරණය
ගොඩනැගිල්ල
වැව
ප්‍රමාණය
වර්ග ප්‍රමාණය - 13.3 km
ප්‍රදේශය - 8.30 km²
40000 0 40000 80000 120000 km
source-Google satelitte image and GPS tracking /desined by DOLG GIS Group ( Shamira )



වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ
දංකොටුව සංවර්ධන ප්‍රදේශ
N
සිතියම
සම්බන්ධීකරණය
ජල මූලාශ්‍ර
ඇල
ගඟ
ජලාශ්‍ර
පාර
පළාත් මාර්ගය
ප්‍රාදේශීය සභාව
මාර්ග සංවර්ධන අධිකාරිය
ගොඩනැගිලි
ප්‍රධාන මාර්ගය
A නාත්තන්ඩිය
B මිගමුව
C පන්නල
ප්‍රමාණය
වර්ග ප්‍රමාණය - 26.6 km
ප්‍රදේශය - 20.1 km²
A
B
C
500 0 500 1000 1500 2000 m
Source: Google Satellite Images & GPS Tracking System
Desinged By: DOLG, Wennappuwa Pradeshiya Sabha & P.P.D.D.S. Serasinghe



වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ කම්මල්පත්තුව
සංවර්ධන ප්‍රදේශ
A
N
සිතියම
ගඟ
ගොඩනැගිල්ල
සම්බන්ධීකරණය
ප්‍රධාන මාර්ගය
පාර
මාර්ග සංවර්ධන අධිකාරිය
පළාත් මාර්ගය
ප්‍රාදේශීය සභාව
A වෙන්නප්පුව
B කොච්චිකඩේ
ප්‍රමාණය
වර්ග ප්‍රමාණය - 34.95 km
ප්‍රදේශය - 9.29 km2
B
100 0 100 200 km
Data Source : Google Satalite Image & GPS Tracking System
Designed BY : DOLG GPS Group


වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ කිරිමැටියාන
සංවර්ධන ප්‍රදේශ
N
A
B
C
D
E
F
සිතියම
සම්බන්ධීකරණය
ගොඩනැගිල්ල
පාර
මාර්ග සංවර්ධන අධිකාරිය
පළාත් මාර්ගය
ප්‍රාදේශීය සභාව
දුම්රිය මාර්ග
ප්‍රධාන මාර්ගය
A දංකොටුව
B කොට්ටාමුල්ල
C තුලාවල
D වෙන්නප්පුව
E බොරලැස්ස
F සිරිගම්පල
ප්‍රමාණය
වර්ග ප්‍රමාණය - 19.1 km
ප්‍රදේශය - 1.19 km2
Data Source : Google Satalite images & GPS Tracking System
Designed by : W.G.A.B. Madusankha & Wennappuwa PS
0 500 1000 1500 2000 m

<u>ප්‍රාදේශිය සභාවේ ගොඩනැගිලි ව්‍යාප්තිය පිළිබඳ සිතියම</u>




# භූමි පරිභෝජනය

භූමිය තුල ඇති නිවාස, කුඹුරු, භූමිය විවිධ කටයුතු සඳහා යොදා ගැනීම, කඳු, වනාන්තර, හිස් ඉඩම්, ආදිය හා ඒවායෙහි අයිතිය පිළිබඳ තොරතුරු නිරූපණය මේ මඟින් සිදු කරනු ලබයි.

මේ මඟින් ප්‍රදේශයේ ඉඩම් බෙදීයෑම, සංවර්ධිත තොරතුරු අධ්‍යනය කිරීමට අවස්ථාව උදාකර ගැනීමට හැකියාව පවතින අතරම ඉක්මනින් සියලු තොරතුරු සපයා ගැනීමටද අවස්ථාව උදා වේ. උදාහරණයක් ලෙස එක් පුද්ගලයෙකුට හිමි ගොඩ හා කුඹුරු ඉඩම් ප්‍රමාණය ක්ෂණිකව හා නිවැරදිව පහසුවෙන් මේ මඟින් සපයා ගැනීමට හැකිය.

කෘෂිකාර්මික කටයුතු නියාමනය සඳහා මෙම තොරතුරු අතිශයින්ම වැදගත්ය. එමෙන්ම වගා නොකළ ඉඩම් හඳුනා ගැනීම හා ඒවාට පිළියම් යෙදීමට අධ්‍යනය කිරීමට හැකියාව පහසුවෙන් පවතී.

# බල ප්‍රදේශයේ භූමි පරිභෝජනය



# ජනගහන ව්‍යාප්ති ස්ථරය

ග්‍රාම නිලධාරී වසම් මට්ටමෙන් වසමේ සියළු ගොඩනැගිලි තොරතුරු මේ යටතේ නිර්මාණය කිරීමට යෝජිත අතර එක් එක් නිවාස වල තොරතුරු හා ඒවායේ පදිංචිකරුවන්ගේ විස්තර මාර්ගයෙන් මාර්ගයට නිර්මාණය කිරීම මේ තුලින් සිදුකිරීමට නියමිතය.

ඒ අනුව මෙම ස්ථරය යටතේ සියළු ගොඩනැගිලි තොරතුරු හා ජන ව්‍යාප්තිය මෙන්ම පවුල් විස්තර ජාලයක් ලෙස සකස් කිරීම සිදුකරනු ලබයි.

# ජනගහනය

## දංකොටුව

| අනු අංකය | වසම | මුළු ජනගහනය | වයස් කාණ්ඩ (අවුරුදු) 0 - 4 | 5-9 | 10-14 | 15 - 19 | 20 - 24 | 25- 29 | 30 - 34 | 35 - 39 | 40 - 44 | 45 - 49 | 50 - 54 | 55- 59 | 60 - 64 | 65 - 69 | 70 -74 | අවු. 75 සහ ඊට වැඩි | එකතුව පුරුෂ | ස්ත්‍රී |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | දික්වල | 1157 | 53 | 74 | 80 | 68 | 83 | 82 | 84 | 98 | 102 | 81 | 67 | 73 | 66 | 51 | 46 | 49 | 562 | 595 |
| 2 | වයෝගියාන | 939 | 19 | 35 | 38 | 59 | 80 | 60 | 76 | 57 | 64 | 60 | 91 | 58 | 75 | 61 | 38 | 68 | 460 | 479 |
| 3 | ජංකුරාවල | 742 | 29 | 45 | 60 | 67 | 36 | 40 | 55 | 93 | 78 | 50 | 37 | 44 | 43 | 19 | 23 | 23 | 368 | 374 |
| 4 | කළුවෙම්මුල් | 1253 | 83 | 83 | 80 | 86 | 96 | 104 | 92 | 90 | 94 | 89 | 93 | 95 | 52 | 47 | 28 | 41 | 599 | 654 |
| 5 | සංගක්කුලිය | 1156 | 48 | 63 | 61 | 58 | 86 | 80 | 81 | 89 | 112 | 85 | 83 | 83 | 54 | 61 | 56 | 56 | 537 | 619 |
| 6 | වසන්දිරියමුල් | 1628 | 99 | 120 | 136 | 94 | 114 | 120 | 88 | 113 | 124 | 100 | 105 | 99 | 80 | 87 | 70 | 79 | 788 | 840 |
| 7 | ලිහිරියාගම | 1195 | 59 | 69 | 84 | 75 | 70 | 101 | 89 | 106 | 103 | 70 | 65 | 76 | 73 | 59 | 35 | 61 | 575 | 620 |
| 8 | මැල්ලව | 2150 | 48 | 88 | 122 | 92 | 156 | 159 | 156 | 163 | 231 | 200 | 148 | 139 | 148 | 99 | 120 | 81 | 1035 | 1115 |
| 9 | වඍ◌ොතුලටලන | 2318 | 136 | 144 | 137 | 126 | 232 | 215 | 161 | 173 | 157 | 168 | 175 | 168 | 133 | 137 | 21 | 35 | 1137 | 1181 |
| 10 | හුන්දිරාපොල | 715 | 40 | 56 | 62 | 17 | 18 | 38 | 78 | 60 | 36 | 43 | 51 | 54 | 71 | 32 | 26 | 33 | 356 | 359 |
| 11 | බ/කහටවිල | 1804 | 86 | 97 | 138 | 154 | 93 | 116 | 122 | 117 | 136 | 136 | 137 | 99 | 111 | 76 | 79 | 107 | 867 | 937 |
| 12 | නැ/කහටවිල | 2381 | 156 | 184 | 128 | 205 | 163 | 192 | 188 | 175 | 169 | 153 | 144 | 168 | 113 | 109 | 88 | 46 | 1096 | 1285 |
| 13 | තුලාවල | 1239 | 85 | 76 | 83 | 94 | 71 | 75 | 82 | 90 | 84 | 86 | 84 | 80 | 65 | 53 | 57 | 74 | 611 | 628 |
| 14 | නැ/කිරිමැටියාන | 1055 | 37 | 98 | 182 | 120 | 37 | 40 | 50 | 77 | 64 | 96 | 58 | 41 | 49 | 29 | 42 | 35 | 522 | 533 |
| 15 | ඍන්සල් හන්දිය | 1408 | 31 | 84 | 182 | 75 | 65 | 104 | 119 | 151 | 122 | 112 | 80 | 64 | 57 | 49 | 29 | 84 | 670 | 738 |
| 16 | මැද/කිරිමැටියාන | 1588 | 78 | 99 | 101 | 104 | 101 | 89 | 131 | 132 | 161 | 119 | 103 | 85 | 73 | 75 | 55 | 82 | 752 | 836 |
| 17 | වබෝතවල්ගම | 1496 | 13 | 44 | 39 | 128 | 126 | 122 | 111 | 250 | 203 | 188 | 91 | 72 | 40 | 32 | 23 | 14 | 731 | 765 |
| 18 | උ/කිරිමැටියාන | 1573 | 64 | 79 | 88 | 72 | 118 | 97 | 105 | 132 | 135 | 107 | 109 | 114 | 97 | 77 | 86 | 93 | 735 | 838 |
| 19 | ද/කිරිමැටියාන | 1058 | 31 | 61 | 63 | 50 | 57 | 87 | 75 | 71 | 108 | 91 | 58 | 58 | 59 | 48 | 68 | 73 | 483 | 575 |
| 20 | බ/කිරිමැටියාන | 1282 | 73 | 66 | 91 | 113 | 94 | 82 | 96 | 95 | 104 | 94 | 68 | 85 | 66 | 46 | 55 | 54 | 597 | 685 |
| 21 | උ/හාල්දඩුලන | 1258 | 75 | 54 | 64 | 75 | 81 | 58 | 68 | 83 | 96 | 85 | 114 | 107 | 84 | 73 | 68 | 73 | 677 | 581 |
| 22 | ද/හාල්දඩුලන | 1168 | 64 | 62 | 73 | 31 | 57 | 83 | 86 | 98 | 121 | 109 | 80 | 64 | 69 | 67 | 56 | 48 | 550 | 618 |
| 23 | මැ/ හාල්දඩුලන | 2772 | 111 | 165 | 174 | 176 | 215 | 168 | 186 | 262 | 227 | 226 | 186 | 167 | 150 | 140 | 116 | 103 | 1332 | 1440 |
| 24 | බ/ හාල්දඩුලන | 2734 | 49 | 77 | 145 | 98 | 130 | 138 | 227 | 242 | 310 | 312 | 254 | 261 | 156 | 127 | 110 | 98 | 1341 | 1393 |
| 25 | ඉ/වමොවහොට්ටිමුල් | 1027 | 57 | 68 | 58 | 75 | 72 | 88 | 100 | 66 | 86 | 77 | 58 | 59 | 49 | 36 | 42 | 36 | 507 | 520 |
| 26 | ඍ/වමොවහොට්ටිමුල් | 1288 | 81 | 48 | 39 | 11 | 118 | 132 | 114 | 113 | 108 | 92 | 91 | 72 | 61 | 67 | 68 | 73 | 627 | 661 |
| 27 | ඍ/බුජ්ජම්වඍ◌ොළ | 1968 | 141 | 107 | 151 | 62 | 150 | 141 | 121 | 127 | 185 | 163 | 169 | 103 | 70 | 75 | 86 | 117 | 906 | 1062 |

| | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 28 | ඉ/බුජ්ජම්වගොළ | 870 | 44 | 60 | 69 | 66 | 61 | 75 | 66 | 61 | 56 | 51 | 54 | 43 | 33 | 49 | 37 | 45 | 417 | 453 |
| 29 | උ/ ඇටියාල | 1087 | 16 | 29 | 27 | 39 | 52 | 85 | 81 | 99 | 81 | 111 | 93 | 71 | 116 | 70 | 48 | 69 | 513 | 574 |
| 30 | ද/ඇටියාල | 2163 | 96 | 134 | 136 | 146 | 116 | 151 | 189 | 187 | 182 | 146 | 112 | 130 | 127 | 109 | 96 | 106 | 1032 | 1131 |
| 31 | වමොටැමුල් | 1655 | 101 | 84 | 100 | 136 | 104 | 107 | 142 | 123 | 137 | 99 | 113 | 103 | 121 | 77 | 63 | 45 | 818 | 837 |
| 32 | මැටිවකොටුල | 2050 | 113 | 107 | 127 | 120 | 115 | 158 | 161 | 149 | 180 | 189 | 145 | 125 | 114 | 74 | 80 | 93 | 997 | 1053 |
| 33 | තාමරකුලිය | 596 | 18 | 43 | 47 | 23 | 36 | 45 | 36 | 54 | 57 | 37 | 39 | 53 | 23 | 31 | 24 | 30 | 282 | 314 |
| 34 | වගොඩැල් | 1801 | 93 | 84 | 96 | 122 | 125 | 144 | 124 | 112 | 142 | 148 | 144 | 113 | 120 | 83 | 57 | 94 | 860 | 941 |
| 35 | වමෝරුක්කුලිය | 2462 | 104 | 125 | 149 | 158 | 161 | 186 | 196 | 204 | 232 | 183 | 172 | 144 | 138 | 113 | 92 | 105 | 1180 | 1282 |
| 36 | උ/ දන්වකොටුල | 672 | 15 | 24 | 34 | 20 | 37 | 53 | 53 | 53 | 67 | 59 | 38 | 40 | 39 | 51 | 39 | 50 | 323 | 349 |
| 37 | ද/දන්වකොටුල | 748 | 48 | 39 | 37 | 38 | 50 | 47 | 49 | 54 | 63 | 51 | 69 | 48 | 37 | 35 | 42 | 41 | 361 | 387 |
| 38 | නැ/දන්වකොටුල | 1790 | 71 | 89 | 95 | 77 | 102 | 143 | 135 | 162 | 161 | 146 | 113 | 119 | 126 | 78 | 89 | 84 | 854 | 936 |
| 39 | බ/දන්වකොටුල | 1526 | 48 | 60 | 96 | 110 | 98 | 97 | 99 | 130 | 165 | 97 | 121 | 107 | 81 | 78 | 57 | 82 | 709 | 817 |
| 40 | ඉ/දූම්මවකොටුල | 1017 | 43 | 42 | 60 | 38 | 63 | 72 | 73 | 96 | 103 | 88 | 78 | 65 | 55 | 55 | 43 | 43 | 473 | 544 |
| 41 | a/දූම්මවකොටුල | 1502 | 93 | 66 | 89 | 78 | 110 | 96 | 104 | 126 | 139 | 150 | 116 | 89 | 67 | 47 | 57 | 75 | 703 | 799 |
| 42 | නැ/කටුවකන්ද | 1622 | 68 | 71 | 87 | 86 | 126 | 148 | 143 | 145 | 129 | 122 | 120 | 111 | 97 | 67 | 38 | 64 | 858 | 764 |
| 43 | බ/කටුවකන්ද | 617 | 24 | 35 | 31 | 51 | 42 | 53 | 46 | 56 | 58 | 42 | 41 | 28 | 34 | 28 | 23 | 25 | 296 | 321 |
| 44 | මැ/ කටුවකන්ද | 1511 | 69 | 118 | 102 | 91 | 95 | 96 | 131 | 133 | 147 | 120 | 82 | 102 | 82 | 65 | 54 | 24 | 739 | 772 |
| 45 | උ/ වගෝනවි | 796 | 13 | 39 | 41 | 50 | 38 | 51 | 60 | 62 | 76 | 84 | 78 | 47 | 59 | 29 | 32 | 37 | 383 | 413 |
| 46 | ද/වගෝනවි | 1628 | 112 | 66 | 75 | 69 | 126 | 86 | 121 | 135 | 132 | 119 | 89 | 117 | 99 | 90 | 85 | 107 | 760 | 868 |
| 47 | මැ/ වගෝනවි | 1113 | 69 | 54 | 26 | 32 | 69 | 87 | 105 | 88 | 103 | 107 | 81 | 87 | 52 | 56 | 48 | 49 | 516 | 597 |
| එකතුල | | **67578** | **3104** | **3615** | **4183** | **3935** | **4445** | **4791** | **5055** | **5552** | **5930** | **5341** | **4697** | **4330** | **3784** | **3117** | **2695** | **3004** | **32495** | **35083** |


# වෙන්නප්පුව

| අනු අංකය | වසම | ස්ත්‍රී/පුරුෂ | ජාතීන් අනුව | වයස් අනුව | මුළු ජනගහනය | වයස් කාණ්ඩ (අවුරුදු) | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | 0 - 4 | 5// 9 | 10// 14 | 15 - 19 | 20 - 24 | 25- 29 | 30 - 34 | 35 - 39 | 40 - 44 | 45 - 49 | 50 - 54 | 55- 59 | 60 - 64 | 65 - 69 | 70 - 75 ට වැඩි |
| 1 | නැ/ලුණුවිල | 2227 | 2227 | 2227 | 2227 | 91 | 180 | 244 | 44 | 120 | 167 | 145 | 172 | 205 | 174 | 143 | 109 | 188 | 83 | 162 |
| 2 | මැ/ලුණුවිල | 5698 | 5698 | 5698 | 5698 | 353 | 361 | 432 | 482 | 464 | 449 | 488 | 462 | 370 | 397 | 404 | 331 | 293 | 186 | 226 |
| 3 | ද/ලුණුවිල | 1441 | 1441 | 1441 | 1441 | 32 | 25 | 32 | 37 | 115 | 98 | 159 | 117 | 137 | 118 | 122 | 117 | 126 | 71 | 135 |
| 4 | බ/ලුණුවිල | 1422 | 1422 | 1422 | 1422 | 34 | 43 | 83 | 61 | 101 | 97 | 98 | 92 | 102 | 198 | 92 | 93 | 123 | 61 | 144 |
| 5 | ද/සිරිගම්පල | 1790 | 1790 | 1790 | 1790 | 104 | 97 | 149 | 36 | 156 | 105 | 100 | 125 | 190 | 99 | 120 | 102 | 80 | 167 | 160 |
| 6 | උ/සිරිගම්පල | 1322 | 1322 | 1322 | 1322 | 78 | 121 | 98 | 57 | 100 | 102 | 89 | 91 | 97 | 73 | 86 | 112 | 79 | 77 | 62 |
| 7 | උඩාසිරිගම | 1203 | 1203 | 1203 | 1203 | 40 | 89 | 91 | 46 | 93 | 69 | 71 | 47 | 134 | 117 | 84 | 32 | 116 | 59 | 115 |
| 8 | උ/බණ්ඩිරිප්පුව | 1281 | 1281 | 1281 | 1281 | 61 | 82 | 91 | 72 | 98 | 83 | 92 | 107 | 100 | 88 | 100 | 86 | 78 | 66 | 77 |
| 9 | නැ/බණ්ඩිරිප්පුව | 2392 | 2392 | 2392 | 2392 | 56 | 48 | 118 | 64 | 184 | 206 | 201 | 257 | 293 | 214 | 169 | 172 | 134 | 123 | 153 |
| 10 | බ/බණ්ඩිරිප්පුව | 1835 | 1835 | 1835 | 1835 | 110 | 155 | 149 | 150 | 68 | 122 | 122 | 143 | 155 | 125 | 112 | 125 | 69 | 82 | 148 |
| 11 | තඹරවිල | 930 | 930 | 930 | 930 | 25 | 40 | 47 | 68 | 64 | 75 | 64 | 66 | 70 | 73 | 67 | 59 | 65 | 58 | 89 |
| 12 | බෝලාන | 1245 | 1245 | 1245 | 1245 | 43 | 74 | 77 | 84 | 102 | 110 | 94 | 80 | 87 | 111 | 88 | 81 | 62 | 89 | 63 |
| 13 | සින්දාත්‍රිය | 1357 | 1357 | 1357 | 1357 | 25 | 33 | 31 | 58 | 39 | 32 | 70 | 105 | 89 | 118 | 98 | 152 | 146 | 182 | 179 |
| 14 | අළුත්තොට | 1390 | 1390 | 1390 | 1390 | 65 | 72 | 73 | 88 | 91 | 87 | 100 | 110 | 115 | 100 | 99 | 105 | 93 | 97 | 95 |
| 15 | කම්මල | 1372 | 1372 | 1372 | 1372 | 31 | 62 | 62 | 81 | 90 | 94 | 108 | 120 | 159 | 134 | 85 | 84 | 75 | 70 | 117 |


| | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 16 | උ/වයික්කාල | 1681 | 1681 | 1681 | 1681 | 72 | 75 | 152 | 114 | 76 | 58 | 81 | 61 | 224 | 137 | 153 | 123 | 115 | 120 | 120 |
| 17 | තෝප්පූතොට | 960 | 960 | 960 | 960 | 34 | 48 | 68 | 80 | 62 | 76 | 74 | 66 | 93 | 68 | 66 | 68 | 46 | 46 | 65 |
| 18 | ද/වයික්කාල | 1532 | 1532 | 1532 | 1532 | 56 | 66 | 66 | 122 | 139 | 130 | 123 | 150 | 125 | 129 | 116 | 100 | 60 | 66 | 84 |
| 19 | රංගම්මූල්ල | 1016 | 1016 | 1016 | 1016 | 39 | 52 | 56 | 56 | 44 | 47 | 63 | 62 | 92 | 93 | 101 | 87 | 88 | 79 | 57 |
| 20 | නැ/අංගම්පිටිය | 1126 | 1126 | 1126 | 1126 | 27 | 70 | 50 | 65 | 63 | 83 | 95 | 73 | 106 | 79 | 91 | 87 | 91 | 49 | 97 |
| 21 | බෝලවත්ත | 1003 | 1003 | 1003 | 1003 | 15 | 18 | 13 | 20 | 66 | 96 | 111 | 100 | 92 | 66 | 81 | 96 | 76 | 49 | 104 |
| 22 | බ/අංගම්පිටිය | 1602 | 1602 | 1602 | 1602 | 66 | 110 | 73 | 67 | 131 | 115 | 286 | 173 | 67 | 152 | 134 | 23 | 73 | 44 | 88 |
| 23 | නැ/නයිනමඩම | 1251 | 1251 | 1251 | 1251 | 35 | 38 | 40 | 46 | 75 | 120 | 146 | 175 | 140 | 153 | 98 | 60 | 45 | 55 | 25 |
| 24 | හණකොටුපල | 1078 | 1078 | 1078 | 1078 | 13 | 34 | 66 | 72 | 75 | 84 | 70 | 59 | 109 | 97 | 73 | 74 | 72 | 66 | 114 |
| 25 | මැ/නයිනමඩම | 2173 | 2173 | 2173 | 2173 | 125 | 232 | 221 | 117 | 117 | 131 | 127 | 131 | 122 | 118 | 143 | 148 | 145 | 142 | 154 |
| 26 | බ/නයිනමඩම | 1420 | 1420 | 1420 | 1420 | 46 | 73 | 77 | 51 | 94 | 85 | 168 | 159 | 141 | 135 | 127 | 99 | 50 | 65 | 50 |
| 27 | වෙල්ලමංකරය | 1587 | 1587 | 1587 | 1587 | 29 | 41 | 112 | 159 | 73 | 91 | 118 | 109 | 132 | 153 | 128 | 131 | 159 | 103 | 49 |
| 28 | උ/මිරිස්සන්කොටුව | 878 | 878 | 878 | 878 | 46 | 43 | 31 | 46 | 53 | 76 | 59 | 53 | 74 | 77 | 62 | 78 | 58 | 48 | 74 |
| 29 | ද/මිරිස්සන්කොටුව | 1197 | 1197 | 1197 | 1197 | 82 | 88 | 86 | 78 | 104 | 126 | 65 | 53 | 74 | 74 | 61 | 67 | 49 | 91 | 99 |
| 30 | නැ/බොරලැස්ස | 1716 | 1716 | 1716 | 1716 | 22 | 75 | 89 | 132 | 110 | 116 | 111 | 156 | 177 | 128 | 130 | 98 | 100 | 104 | 168 |
| 31 | උ/බොරලැස්ස | 1278 | 1278 | 1278 | 1278 | 63 | 60 | 93 | 72 | 101 | 73 | 101 | 97 | 110 | 102 | 103 | 89 | 79 | 74 | 61 |
| 32 | බ/බොරලැස්ස | 1520 | 1520 | 1520 | 1520 | 29 | 41 | 112 | 152 | 63 | 81 | 108 | 99 | 122 | 143 | 128 | 131 | 159 | 104 | 48 |
| 33 | ද/බොරලැස්ස | 1041 | 1041 | 1041 | 1041 | 47 | 54 | 42 | 43 | 69 | 62 | 88 | 88 | 103 | 74 | 80 | 65 | 63 | 61 | 102 |
| 34 | බ/දූම්මලදෙනිය | 1512 | 1512 | 1512 | 1512 | 44 | 62 | 85 | 142 | 56 | 104 | 132 | 102 | 125 | 124 | 119 | 143 | 98 | 71 | 105 |
| 35 | මැ/දූම්මලදෙනිය | 2111 | 2111 | 2111 | 2111 | 109 | 195 | 188 | 115 | 118 | 131 | 112 | 116 | 159 | 152 | 135 | 112 | 131 | 158 | 180 |
| 36 | නැ/දූම්මලදෙනිය | 1141 | 1141 | 1141 | 1141 | 39 | 60 | 75 | 88 | 83 | 85 | 80 | 88 | 99 | 91 | 77 | 80 | 63 | 47 | 86 |
| 37 | උ/දූම්මලදෙනිය | 1029 | 1029 | 1029 | 1029 | 34 | 36 | 48 | 51 | 96 | 113 | 101 | 85 | 87 | 93 | 79 | 88 | 36 | 13 | 69 |

| | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 38 | ද/දුම්මලදෙනිය | 1071 | 1071 | 1071 | 1071 | 21 | 83 | 103 | 42 | 83 | 55 | 39 | 131 | 42 | 70 | 45 | 138 | 73 | 83 | 63 |
| 39 | උ/වෙන්නප්පුව | 2068 | 2068 | 2068 | 2068 | 69 | 78 | 126 | 92 | 141 | 153 | 146 | 197 | 202 | 170 | 171 | 140 | 115 | 94 | 174 |
| 40 | ද/වෙන්නප්පුව | 2137 | 2137 | 2137 | 2137 | 84 | 173 | 167 | 82 | 139 | 153 | 197 | 252 | 227 | 177 | 115 | 113 | 109 | 103 | 46 |
| 41 | මැ/වෙන්නප්පුව | 1489 | 1489 | 1489 | 1489 | 49 | 86 | 98 | 52 | 98 | 101 | 119 | 188 | 154 | 139 | 127 | 105 | 76 | 57 | 40 |
| 42 | බ/වෙන්නප්පුව | 2147 | 2147 | 2147 | 2147 | 130 | 127 | 159 | 136 | 119 | 114 | 137 | 155 | 150 | 192 | 120 | 123 | 123 | 123 | 239 |
| 43 | නැ/වෙන්නප්පුව | 1506 | 1506 | 1506 | 1506 | 22 | 35 | 33 | 50 | 217 | 192 | 190 | 170 | 110 | 105 | 95 | 120 | 100 | 40 | 27 |
| 44 | උ/උල්හිටියාව | 1947 | 1947 | 1947 | 1947 | 40 | 181 | 182 | 174 | 98 | 111 | 125 | 119 | 121 | 134 | 139 | 121 | 132 | 135 | 135 |
| 45 | ද/උල්හිටියාව | 2365 | 2365 | 2365 | 2365 | 51 | 120 | 95 | 97 | 188 | 107 | 181 | 305 | 268 | 292 | 211 | 127 | 208 | 84 | 31 |
| 46 | මැ/උල්හිටියාව | 2509 | 2509 | 2509 | 2509 | 66 | 159 | 220 | 283 | 89 | 120 | 145 | 148 | 164 | 175 | 178 | 186 | 189 | 193 | 194 |
| 47 | බ/උල්හිටියාව | 1876 | 1876 | 1876 | 1306 | 144 | 162 | 154 | 125 | 105 | 84 | 114 | 121 | 144 | 122 | 136 | 127 | 112 | 75 | 151 |
| 48 | කඩවත | 1544 | 1544 | 1544 | 1544 | 44 | 46 | 54 | 62 | 98 | 113 | 134 | 169 | 160 | 161 | 128 | 111 | 79 | 80 | 105 |
| 49 | නැ/කොළින්ජාඩිය | 1015 | 1015 | 1015 | 1015 | 37 | 71 | 69 | 50 | 69 | 70 | 61 | 76 | 92 | 93 | 72 | 66 | 56 | 55 | 78 |
| 50 | බ/කොළින්ජාඩිය | 1879 | 1879 | 1879 | 1879 | 41 | 52 | 39 | 104 | 61 | 52 | 63 | 116 | 190 | 208 | 125 | 197 | 172 | 164 | 295 |
| 51 | උ/කොළින්ජාඩිය | 1342 | 1342 | 1342 | 1342 | 48 | 52 | 55 | 64 | 82 | 91 | 110 | 127 | 165 | 118 | 89 | 94 | 92 | 53 | 102 |
| 52 | ද/කොළින්ජාඩිය | 986 | 986 | 986 | 986 | 31 | 63 | 70 | 43 | 69 | 75 | 74 | 91 | 96 | 86 | 67 | 57 | 50 | 43 | 71 |
| | | 82638 | | | | | | | | | | | | | | | | | | |


# ජනගහන ව්‍යාප්ත සිතියම



# බල ප්‍රදේශයට අයත් ආගමික ස්ථාන සිතියම



# බල ප්‍රදේශයට අයත් පාසල සිතියම











# ජල හා වාරිමාර්ග ස්ථරය

බල ප්‍රදේශයේ ඇති සියලුම ඇළ මාර්ග,වැව් අමුණු ආදිය තොරතුරු නිර්මාණය කරන අතර මේ මඟින් සංවර්ධන කාර්යය සඳහා තොරතුරු පහසුවෙන් හා නිවැරදිව ලබා ගැනීමට අවස්ථාව උදාවනු ඇත.

ප්‍රධාන වශයෙන් කෘෂිකර්මාන්තය පදනම්ව සකස් වූ සංස්කෘතියකට උරුමකම් කියන රට තුළ ඇති වාරි පද්ධතිය පිළිබඳ තොරතුරු මගින් සංවර්ධන ඉලක්ක ලඟා කර ගැනීම සිදුකළ හැකිය.

# බල ප්‍රදේශයේ ජල මූලාශ්‍ර සිතියම



## ගිං ඔය

සැතපුම් ගණනක් දුර ගෙවමින් දෙමටපිටිය ප්‍රදේශයෙන් බල ප්‍රදේශයට ප්‍රවිශ්ය වන ගිං ඔය කොමළිය ඇගේ ගමන නිමා කරමින් මුහුදට එක්වීමට ආසන්නම ප්‍රදේශය වන බැවින් වෙන්නප්පුව බල ප්‍රදේශය හරහා වෙහෙසකර වූ ඉතා සෙමින් ගමනක යෙදේ. අර්ධ නාගරික ප්‍රදේශයක් වන වෙන්නප්පුව බල ප්‍රදේශයේ පවත්නා අධික උෂ්ණුසුමට ඇගේ ගමන ස්වභාවික සිසිලසක් ගෙන දෙනු ලබයි. නයිනමඩම, රංගම්මුල්ල ප්‍රදේශ පසුකර සින්දාත්ත්‍රිය ප්‍රදේශයෙන් ඇය ඇගේ ගමන නිමා කරයි. ගිං ඔයට අයක් ජල ධාරා ප්‍රදේශ එතරම් වීශාල නොවේ. එබැවින් වැසිකාල වලදී හැර අනෙකුත් කාල වලදි ප්‍රබල දිය පහරක් මෙයින් ගලා යන නොයන අතර, මෙම නිසා වඩ දිය හා බා දිය මඟින් මෙම ජල වහනයට විශාල බලපෑමක් කරනු ලබයි.

ගිං ඔය සඳහා වෙල්ලමංකරය හා කම්මල් මෝය නමින් මෝය දෙක හිමිය පැරණි ක්‍රමය අනුව ගිං ඔයේ ජලය මුහුදට ගලා බැස්සේ කම්මල මෝය තුලින් මා ඔයට සම්බන්ධ වීමෙනි. එහිදි ස්වභාවිකව ඇති වන වැලිතලාව කැපීමෙන් හෝ මා ඔය හා ගිං ඔයේ ප්‍රබල ජල පීඩනය මඟින් බිඳී යාමෙන් හෝ කම්මල් මෝය ක්‍රියාත්මක විය නමුත් වර්තමානයේදී කම්මල් මෝය අක්‍රිය තත්ත්වයට පත්ව ඇත. වර්ෂා කාලයේදි මා ඔයේ සහ ගිං ඔයේ ජල මට්ටම ඉහළ යන විට යම් පිරිස් විසින් කම්මල් මෝය නොකපා මා ඔය මෝය කපා ජලය මුහුදට මුදා හැරීමට මෙයට හේතුවයි. තවද ගිං ඔයේ ජලය සායියන්කුලම ඇළ මාර්ගය ඔස්සේ මා ඔයට බැසයාම නිසා කම්මල මෝය බිඳී යාමට තරම් විශාල ජල පීඩනයක් ඇති නොවීමද මෙයට හේතු කාරක වේ.



# ගිං පොල්

ගිං ඔය සහ මෝදු දෙපස බහුල ලෙස දැකිය හැකි මෙම ශාක වර්ගය ශ්‍රී ලංකාවේ කඩොලාන ශාක අතරින් තාල වර්ගයට අයත් එකම ශාක වර්ගයද වේ. අඩි 12 පමණ උසැති ගිං පොල් ශාකයේ කොළය නාරටියෙන් දික් වී පොල් අත්තක හැඩය ගනී. සැරසිලි සඳහා මෙම අතු සහ ගෙඩි ප්‍රයෝජනයට ගන්නා අතර, ගිං පොල් මදය රසවත් ආහාරයක් වේ. ගිං පොල් වතුරද රසවත්ය. එමෙන්ම මී රා කර්මාන්තයටද මෙය ප්‍රයෝජනවත් වේ. ගිං පොල් ශාකය කකුළුවන් මත්ස්‍යයින්ගේ ජීවන චක්‍ර ක්‍රියාවලියට උපකාරී වේ.





# සිංහ ඔයේ ශාක ප්‍රජාව

සිංහ ඔය උද්‍යානයට වැටීමට ආසන්න ප්‍රදේශය වෙන්නප්පුව බල ප්‍රදේශය බැවින්, එහි දෙපස ඇති ශාක කඩොලාන ශාක විශේෂයෙන් යුක්ත වේ. එම ශාක විශේෂ 22 ක් පමණ ඇති අතර, ලංකාවට ආවේණික වූ විශේෂ 12 ක් දක්නට ඇත. එනම්,


- සිංහ පොල්
- මන්ද කටු
- මහකටු
- මල් කඩොල්
- තෙල
- කටු ඉකිළි
- ඇගියුලාව
- ඇටිසිනියා

මේ අතර වේ.






## ගිං ඔයේ ජීවත් වන මත්ස්‍ය ප්‍රජාව



- ආඳා
- මඩකනයා
- පෙතියා





- ලූලා
- අයිරාව



- හුංගා
- කොළකනයා
- කකුළුවන් වර්ග

(මිරිදිය මසුන් විශේෂ 20 ට වැඩි සංඛ්‍යාවක් මෙහි ජීවත් වේ)



# <u>වෙන්නප්පුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට බලපෑ හැකි ස්වභාවික ආපදා අවදානම්</u>

වර්ථමානයේ ලෝකයේ ස්වභාවික ආපදාවන් ඇතිවීමේ අවදානම දිනෙන් දින ඉහළ නඟිමින් පවතිනවා.එයට . .ප්‍රධානතම හේතුවක් ලෙස මිනිස් ක්‍රියාකාරකම් හා මිනිසා සොභාදහමට අකාරුණික වීම ඉදිරිපත් කළ හැකියි පසුගිය කාල වකවානුව තුල අප ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ද ස්වභාවික අනතුරු බහුල කාලයක් පවට පත් වුණා.

## <u>ගංවතුර</u>

සාමාන්‍යයෙන් ජලයෙන් යට නොවී පවතින ප්‍රදේශයක්, කෙටි කාලයක් තුළ අධික වර්ෂාපතනයක් ලැබීම හේතුවෙන් ජලයෙන් යට වීම ගං වතුරක් හෙවත් ජල ගැලීමක් ලෙස හැඳින්වේ. ජල ගැලීම් ඇති වන ආකාරය අනුව ඒවා මෙසේ වර්ග කළ හැකි ය.

- පිටාර ගැලීමෙන් ඇති වන ජල ගැලීම් - ගංගා ඇතුළු ජල මාර්ග පිටාර ගැලීම නිසා ජල ගැලීම් ඇති වේ.
- ක්ෂණික ජල ගැලීම් - නාගරික ප්‍රදේශවල වතුර බැස යන කාණු, ඇළ මාර්ග අවහිර වීම නිසා මෙම තත්ත්වය ඇති වේ.



<u>**ජල ගැලීම් ඇති වීමට බලපාන හේතු**</u>

- අධික වර්ෂාපතනය
- ජලය බැස යන මාර්ග අවහිර වීම්
- වන වැස්ම ඉවත් වීම

- අක්‍රමවත් ඉඩම් පරිහරණය
- ජලාශවල ධාරිතාව අඩු වීම.
- අවිධිමත් ගොඩ කිරීම්
- අක්‍රමවත් ඉදි කිරීම්

**ජල ගැලීම හේතුවෙන් ඇති වන බලපෑම්**

- ජීවිත හානි සිදුවීම.
- විදුලි සැපයුම, ප්‍රවාහන සේවා, පොදු සේවා අඩාල වීම.
- නිවාස, දේපළ මාර්ගවලට අලාභ හානි සිදුවීම.
- ජල මූලාශ්‍ර අපවිත්‍ර වීම නිසා ගංවතුරෙන් පසු විවිධ බෝ වන රෝග පැතිරී යාම.


## ගංවතුර අවදානම වෙන්නප්පුව ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයට බලපාන ආකාරය

ප්‍රදේශයේ විශාල දේපල හානියක් සිදුකරමින් වාර්ථා වූ .ආපදා තත්වය වන්නේ ගංවතුර ආපදාවයි සාමාන්‍ය .ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී වසම් රැසක ජනතාවක් මෙම ආපදා තත්වය නිසා පීඩාවට පත් විය රජයේ ආයතන රැසක්ද මෙම ආපදා ත්තවය නිසා විශාල ආර්ථික ,ජන ජීවිතයට මෙන්ම පාසල් බලපෑමකට ලක්විය .

ඒ සඳහා විසදුම් ඉදිරිපත් කිරීම වෙන්නප්පුව ප්‍රාදේශිය සභාවේ හා වයඹ පළාත් භූගෝලීය තොරතුරු තාක්ෂණික ඒකකයේ සහය ඇතිව සිදුකරනු ලැබිණි.
වර්ෂයේ මැයි හා නොවැම්බර් මාසවලදී වෙන්නප්පුව බල ප්‍රදේශයට අධික වර්ෂාවක් ලැබෙන කාල වකවානුව බැවින් මෙම මාසවලදී ගංවතුර ආපදා අවධානමට ලක්විය හැකි කාලයක් බව නිගමනය කළ හැකියි.

ගංවතුර අවදානමට ලක්වන වැඩිම ආපදා තත්වයක් වාර්ථාවන්නේ බටහිර කොලින්ජාඩිය හා දකුණු
කොලින්ජාඩිය වසම් අයත්වන රන්දියගම ග්‍රාමයටයිර්ට අමතරව බල ප්‍රදේශයේ උතුරු සීමාවේ සිට
නයිනමඩම පාලම දක්වා කොළඹ හලාවත ප්‍රධානමාර්ගයෙන් බස්නාහිර දෙසට ඇති භූමි කොටසේ
බොහෝ තැන්දසින්දාත්‍රිය ප්‍රදේශයන්හී ස්ථාන කිහිපයක්ද ගංවතුර අවධානමට ,තඹරවිල ,වයික්කාල ,
ගොදුරු වේභූමියෙහි පිහිටීමඅනවසර ඉදිකිරීම් හා ඉඩම් හා වගුරු බිම් ගොඩ කිරීම් මෙම ආපදා ,
. තත්වයන් ඇති වීමට හේතුව ලෙස දක්නට හැකියි
අවිධිමත් ඉදිකිරීම් ජලය බැස යන මාර්ග අවහිර කිරීම් වැනි මිනිස් ක්‍රියාකාරකම් ,අවිධිමත් ගොඩ කිරීම් ,
නියාමනයකින් සිදු කරමින් කාණු පද්ධතිය විධිමත් ලෙස නවීකරණය කරමින් මෙම ආපදා තත්වයන්
නිසි ලෙස කළමණාකරනය කරමින් පවතී

ගං වතුර ආපදා සිතියම



# <u>සුනාමි</u>

තවද මෙය .යන්නයි ‘විශාල රල‘ යනු ජපන් භාෂාවට අයත් වචනයක් වන අතර එහි අරුත ‘සුනාමි‘ .ලෙසද හදුන්වනු ලබයි ‘උදම් රළ‘
සුනාමි තරංගයක් යනුවෙන් හදුන්වනු ලබන්නේ සාගර ජල කඳ ක්ෂණිකව කැළඹීමකට ලක්වීසිරස්ව , ඇති වන ජල තීරුවක් නිසා සැදෙන දිය රැල්ලක් හෝ දිය රල කිහිපයක් එකතු වීමෙන් හට ගන්නා තරංගයන්ය .



## සුනාමි ක්‍රියාකාරීත්වයේ ඓතිහාසික තොරතුරු

මෙයට වසර 8000කට පමණ පෙර ගිණිකන්දක් පිපිරීම හේතුවෙන් මධ්‍යදරණී මුහුද ආශ්‍රිතව සුනාමි තත්වයක් ඇතිවී තිබෙන බවට තොරතුරු පවතී .

ලෝකයේ පැරණිම ගොඩගැලීම ලෙස සඳහන් වන්නේ මීට වසර රාම රාවනා .කට පෙරය 2500 යුද්ධයේදී භාවිතා කළ දරුණු යුධ උපකරණ හේතුවෙන් හිම දියවී යාම නිසා මුහුද ගොඩගැලීමක් සිදු වූ 970ක්ද විනාශ වූ බව රාජාවලියේ සඳහන් වායන් ,470ක්ද බව හා මෙම ගොඩ ගැලීමෙන් ධීවර ගම්මාන .වේ

මීට වසර 2000කට පමණ පෙර කැළණි තිස්ස රජු විසින්භික්ෂුවක් මරා දැමූ ශාපය නිසා මුහුද ගොඩගැලීමක් සිදු වූ බව මහා වංශයේ සඳහන් වේ.

සුනාමි පිළිබඳ අන්තර්ජාලයේ සඳහන් කරන ආකාරයට ක්‍රි:පූ:500දී ස්කොට්ලන්තයේ සුනාමි තරංග වල බලපෑමක් සිදු වී ඇත අත්ලන්තික් සාගරයේ සිදු වී ඇති හදිසි භූ චලනයක් මෙම සුනාමි තරංග නිර්මාණය . වීම කෙරෙහි ඉවහල් වී ඇත.

මේ අනුවගිනිකඳු පිපිරීම මඟින් සුනාමි තත්වයන් ඇති වූ බව මෙතෙක් /නායයාමකින් /භූමිකම්පාවකින් , .ලෝකයේ වාර්ථා වූ සුනාමි තත්වයන් වලින් හෙලිවේ
ඊට අමතරව ලොව නන්දෙසින්විශේෂයෙන්ම ජපානය ආශ්‍රිතව නිරන්තර සුනාමි තත්වයන් වාර්ථාවී ඇති , අතර මෑත යුගයේ දී ඇති වූ සුනාමි තත්ත්වය අප රටට මුහ්ණ දෙන්නට සිදුවූ අඳුරු අද්දැකීමක් 2004 .ලෙස හැඳින්විය හැක


**සුනාමි අවදානම වෙන්නප්පුව ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයට බලපාන ආකාරය**

ඉන්දියන් සාගරයට මායිම්ව පිහිටා ඇති වෙන්නප්පුව ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයට බලපෑහැකි දරුණු ආපදාවක් ලෙස සුනාමි ව්‍යවසනය හදුනාගත හැකියි.


සුනාමි අනතුරු ඇඟවීමේ කුළුණු රටා වටා වෙරල තීරයේ දක්නට ඇති අතර මුහුදු මට්ටමේ සිට මීටර් 500ක් දක්වා දුරට වන ප්‍රදේශය වැඩිපුර සුනාමි ආපදාවට ලක්විය හැකි බැවින් අප ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේද සුනාමි අනතුරු ඇඟවීමේ සංඥා කුළුණක් වෙන්නප්පුව වෙරල තීරයට ආසන්නව කඩවත ග්‍රාම නිලධාරී වසමේ ස්ථාපිතව පවතී. මෙම ආපදා අණතුරු ඇඟවීමේ කුළුණ ජාතික ආපදා මෙහෙයුම් මධ්‍යස්ථානයේ නිරන්තර අධීක්ෂණය හා නඩත්තුව යටතේ පවත්තවාගෙන යනු ලබයි.

සුනාමි අනතුරකදී ආරක්ෂිතම ප්‍රදේශය ලෙස බල ප්‍රදේශයේ උස වැඩිම ස්ථානය වන කළුමූකලාන රක්ෂිතය නම් කළ හැකියි.

# HAZARD AREA IN WENNAPPUWA PS AREA & ASSEMBLING PLACES





Source: Google Satallite images & Wennapuwa ps
Designed by : GIS UNIT NWP & Wennapuwa PS
Date : 2024.02.23






බල ප්‍රදේශයේ
කෘෂිකාර්මික ප්‍රදේශ


# බල ප්‍රදේශයේ භූමි පරිභෝජනය



බල ප්‍රදේශයේ ධීවර කලාප සහ ධීවර තොටුපල සිතියම












# බල ප්‍රදේශයේ වෙරළ තීරය


# ප්‍රාග්ධන වියදම් - 2022/2023/2024









# පුනරාවර්තන වියදම් - 2022/2023/2024



ප්‍රාදේශිය සභාව සතු සේවා ස්ථාන




# WORK PLACES OF WENNAPPUWA PRADESHIYA SABHA

## LEGEND


PS PROPERTY

- AYURVEDIC CENTER
- CHILDREN"S PARK
- CREMATORIUM
- HEAD OFFICE
- LIBRARY
- PUBLIC TOILET
- PLAY GROUND
- PRE SCHOOL
- SUB OFFICE
- SHOPPING COMPLEX
- SOLID WASTE CENTER
- WEEKLY FAIR
- GN_BASSE_LINE

SOURCE : GOOGLE SATTELITE & GPS TRACKING
DESIGNED : M G T K FERNANDO & WENNAPPUWA PRADESHIYA SABHA GIS UNIT
DATE : 2025/02/24

# ප්‍රාදේශිය සභාව සතු ආයුර්වේද මධ්‍යස්ථාන

## AYURWEDIC CENTERS IN WENNAPPUWA PRADESHIYA SABHA - 2024




AYURVEDIC CENTER
- NIDAHAS AYURVEDIC CENTER - DANKOTUWA
- NIDAHAS AYURVEDIC CENTER - GALAWATHTHA
- NIDAHAS AYURVEDIC CENTER - SIRIGAMPALA
- NIDAHAS AYURVEDIC CENTER- KALUWACHCHIMULLA
- NIDAHAS AYURVEDIC CENTER- KAMMALPATHTHUWA
- WENNAPPUWA AREA







QR CODE
WEN PS


SOURCE : GOOGLE SATTELITE MAP & GPS TRACKING
DESIGNED : M G T K FERNANDO & WENNAPPUWA PS GIS UNIT
DATE :2025/01/21

# ප්‍රාදේශිය සභාව සතු පුස්තකාල



# ප්‍රධන කාර්යාලය හා උප කාර්යාලයන්

## OFFICE AREA IN WENNAPPUWA PRADESHIYA SABHA






WEN PS
OFFICE AREA








# ප්‍රාදේශිය සභාවට අයත් ක්‍රීඩාපිටි

## PLAY GROUNDS IN WENNAPPUWA PRADESHIYA SABHA



ප්‍රාදේශිය සභාවට අයත් පෙර පාසල් සේවා


# PRE SCHOOL DATA
# WENNAPPUWA PRADESHIYA SABHA

LEGEND


WENNAPPUWA PRE SCHOOL
- ANGAMPITIYA SIGIRHI PRE SCHOOL
- DANKOTUWA PRADESHIYA SABHA PRE SCHOOL
- ETAMBAGAHAWATTA SAMAGI PRE SCHOOL
- HALDANDUWANA KAKULU PRE SCHOOL
- KAMMAL ST.ODILIYA PRE SCHOOL
- KATUKENDA SAMADHI PRE SCHOOL
- KIRIMETIYANA WATTA BUDDHIDANA PRE SCHOOL
- LIHIRIYAGAMA SRI SOMANANDA PRE SCHOOL
- MAHAYAYAWATTA SINGHA PRE SCHOOL
- MATIKOTUWA SINGITHI PRE SCHOOL
- MAWATTA LANKA MATHA PRE SCHOOL
- MELLAWA SRI DHARMARAMA PRE SCHOOL
- MELWATTA DIYAWARA PRE SCHOOL
- NELUM WEWA NIPUNA PRE SCHOOL
- THULAWALA SRI SIRINIWASA PRE SCHOOL
- ANGAMPITIYA SIGITHI PRE SCHOOL
- HALDANDUWANA KEKULU PRE SCHOOL
- KIRIMETIYANA WATTA BUDDHIDHANA PRE SCHOOL
- WENNAPPUWA AREA

0 1 2 3 4 5 6 7 8 9 10 11 km

SOURCE : GPS TRACKING & GOOGLE SATELLITE MAP
DESIGNED : K.J.P.S.S.FERNANDO &
WENNAPPUWA PS GIS UNIT
DATE : 2025.01.15




# ප්‍රාදේශිය සභාවට අයත් සතිපොළ



# ප්‍රාදේශිය සභාවට අයත් වෙළඳ සංකීර්ණ

## RENTAL SHOPS IN WENNAPPUWA PRADESHIYA SABHA AREA




LEGEND
- RENTAL SHOP
- GND






SOURCE : GOOGLE SATTELITE & GPS TRACKING
DESIGNED : M G T K FERNANDO & WEN/PS/GIS UNIT
DATE : 2025/04/08

වෙළඳ බලපත්‍ර

# ENVIRONMENTAL PERMITS IN WENNAPPUWA PREADESHIYA SABHA




**LEGEND**

- ENVIRONMENTAL PERMITS
- ROAD NETWORK
- WENNAPPUWA AREA


TO ATTRIBUTE

SCAN ME


0 2.5 5 7.5 10 km


SOURCE : GOOGLE MAP & GPS TRACKING
DESIGNED : K.J.P.S.S.FERNANDO & WENNAPPUWA PS GIS UNIT
DATE : 2025.04.09

# ප්‍රාදේශීය සභාවට අයත් ආදාහනාගාර




# ප්‍රාදේශිය සභාවට අයත් මිනීපිට්ටනි








# ප්‍රාදේශිය සභාවට සනඅපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය



# බල ප්‍රදේශයේ සිදු වූ ළමා අපරාධ 2022/2023





# ඓතිහාසික හා සංස්කෘතික තොරතුරු

බල ප්‍රදේශය තුල පිහිටි
විහාරස්ථාන,
පූජාභූමි,
අනිකුත් සිද්ධස්ථාන,
පුරාවිද්‍යාත්මක ස්ථාන,
සංස්කෘතික ගම්මාන හා ස්ථානයන්හි පිහිටීම,
ඉතිහාසය හා වැදගත්කම පිළිබඳ
තොරතුරුසපයයි.


# බල ප්‍රදේශයේ සංස්කෘතික ස්ථාන



# බල ප්‍රදේශයේ බැංකු සේවා




# බල ප්‍රදේශයේ රෝහල්




HOSPITALS IN WENNAPPUWA PRADESHIYA SABHA AREA
100000.000
110000.000
240000.000
230000.000
N
DIVISIONAL HOSPITAL LUNUWILA
LIFE CARE HOSPITAL
DIVISIONAL HOSPITAL DANKOTUWA
LIFE CARE HOSPITAL
LEGEND
ROADS
PRDD
PS
PVT
RDA
HOSPITAL
GN_BASSE_LINE
0 1 2 km
SOURCE : GOOGLE SATTELITE & GPS TRACKING
DESIGNED : M G T K FERNANDO & WENNAPPUWA PRADESHIYA SABHA GIS UNIT
DATE : 2025/02/20

# බල ප්‍රදේශයේ හෝටල්


## HOTELS IN WENNAPPUWA AREA




# බල ප්‍රදේශයේ කර්මාන්තශාලා




# බල ප්‍රදේශයේ කර්මාන්තපුර





# බල ප්‍රදේශයේ ඩෙංගු ව්‍යාප්තිය








# බල ප්‍රදේශයේ මාර්ග අනතුරු







# බල ප්‍රදේශය තුල සිදු වූ සිය දිවි නසා ගැනීම්







# බල ප්‍රදේශය තුල සිදු වූ අපරාධ



# බල ප්‍රදේශය තුල ඇති පොලිස් වසම්

## POLICE STATIONS IN WENNAPPUWA PRADESHIYA SABHA








LEGEND

POLICE STATION
- DANKOTUWA POLICE STATION
- KOSWATTA POLICE STATION
- UDASIRIGAMA POLICE STATION
- WENNAPPUWA POLICE SATION


ROAD
- PRDD
- PS
- PVT
- RDA
- GND

SOURCE : GOOGLE SATTELITE & GPS TRACKING
DESIGNED : M G T K FERNANDO & WENNAPPUWA PS GIS UNIT
DATE : 2025/03/20


# බල ප්‍රදේශය තුල මී උණ ව්‍යාප්තිය




# බල ප්‍රදේශය තුල පැපොල ව්‍යාප්තිය




# මහජන සෞඛ්‍ය පරීක්ෂක කලාප



# මහජන සෞඛ්‍ය පරීක්ෂක කලාප



# බල ප්‍රදේශය තුල ඇති දුම්රියපොළ ස්ථාන

